කැලණිය අධ්‍යාපන කලාපය
මධ්‍ය වාර පරීක්ෂණය - 2015
නාට්‍ය හා රංග කලාව

6 ශ්‍රේණිය කාලය පැය 1 මිනි. 30

1 කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- පහත සඳහන් වාක්‍ය නිවැරදි නම් √ ලකුණ ද වැරදි නම් × ලකුණ ද වරහන් තුළ යොදන්න.

1) පාරම්පරික සංස්කෘතික දායාදයක් ලෙස ජනකතා හැඳින්විය හැකිය. ( )
2) කතන්දරයක ප්‍රබල සංවාද හා රංග විධාන ඇතුළත් පිටපතක් ඇත. ( )
3) නාට්‍යයක එක් චරිතයක් තුළ විවිධ භූමිකා ඇත. ( )
4) දෙවියන්, යෝධයන්, සුරංගනාවියන්, රාක්ෂයන් අධිමානුෂ චරිත වේ. ( )
5) "තොප්පි වෙළෙන්දා" ජන කතාවකි. ( )

- හිස්තැනට අදාල පිළිතුර වරහන තුළින් තෝරා ලියන්න.

( සංවාද, ශ්වසන, මේවර කෙළිය සිරිත් මල්දම, උදෑසන)

6) දරුවන්ගේ භාවිතයට සුදුසු ග්‍රන්ථයක් ලෙස ................................ හැඳින්විය හැක.
7) හඬ පාලනය කර ගැනීම සඳහා ..................................... අභ්‍යාස නිරත වීම වැදගත්වේ .
8) .........................ඇති වීමට චරිත දෙකක් හෝ ඊට වැඩි ගණනක් සහභාගී විය යුතුය.
9) ..................................පැරණි ජන ක්‍රීඩාවකි.
10) හිරු නැගීම, මල් පිපීම, කුරුළු නාදය ආදිය .......................සිදුවන සාමාන්‍ය සිදුවීම් වේ.

- නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

11) "මැනලද පුතේ කිරි දුන්නේ මා නුඹට" මෙලෙස පවසන චරිතය වන්නේ,
 1. ලේලිය ය. 2. පුතා ය.
 3. අම්මා ය. 4. ආච්චි ය.

12) පෙර සූදානමකින් තොරව ඉදිරිපත් කරන නිරූපනය හඳුන්වන්නේ,
 1. අනුකරණය 2. සමාරෝපණය
 3. ක්ෂණික නිරූපනය 4. චරිත නිරූපනය

13) සොම්නස් සහගත අවස්ථාවකි,
 1. ලිස්සා වැටීම 2. සුරතල් සතා අහිමි වීම
 3. විභාග ජය ලැබීම 4. දුරකතනය නැතිවීම

14) කෘත්‍රිම ශබ්දයක් ලෙස හැඳින්විය හැක්කේ,
 1. කුරුළු ගීත 2. අකුණු ගැසීම
 3. පොල්කටු දෙකක් තට්ටු කිරීම 4. දියපාරක් ගලා යාම

15) "තැන තැන රවුමට ඉඳගෙන........." මෙය,
 1. මේවර කෙළි කවියකි 2. ගුවන් විදුලි ගීතයකි
 3. එළුවන් කෑම කවියකි 4. රබන් කවියකි

• නිවැරදි පිළිතුර තෝරා යා කරන්න.

| A | B |
|---|---|
| 16) "පාසලට යන එන………" | ලේන්සු හැංගීම ක්‍රීඩාවේදී භාවිතා වේ. |
| 17) හාවෝ, මුවෝ, ගෝන්නු, සිංහරාජයා… | රංග උපකරණයක් ලෙස කෝදුව භාවිතා කල හැක. |
| 18) කැත්තක් අරගෙන වත්තට යන කොට | සිරිත් මල්දමෙහි ඇතුලත් කවියකි. |
| 19) කොප්පර කොප්පර පිපිඤ්ඤා | විවිධ හැගීම් දනවන ලෙස භාවිත කල හැකි රබන් කවියකි. |
| 20) කඩුවක් ලෙස, වේවැල ලෙස, පනාව ලෙස | අහස කඩා වැටීම කතාන්දරයේ චරිත වේ. |

(1×20 - 20)

## ii පත්‍රය

පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න 03 කට පිළිතුරු සපයන්න.

පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ

1) 1. පාසල තුළදී ඔබට හමුවන චරිත 02ක් නම් කරන්න.
2. මෙම චරිත හා සම්බන්ධ උපකරණ 02 ක් නම් කරන්න.
3. එම චරිත තුළින් ගත හැකි ආදර්ශ 02 ක් ලියන්න.
4. පරිසරයේ දැකිය හැකි සවාභාවික වස්තු 02 ක් නම් කරන්න.
5. පරිසරය ආරක්ෂා කිරීමට ඔබ කරණ කාර්ය 02 ක් ලියන්න.

(ලකුණු 2×5)

2) 1. රංගනයේදී උපයෝගී කර ගන්නා භාණ්ඩ හඳුන්වන නම කුමක්ද? (ලකුණු 02)
2. ක්ෂණික නිරූපනයක් ඉදිරිපත් කිරීමට සිදුවුවහොත් පංති කාමරය තුළින් සොයා ගත හැකි උපකරන 02 ක් නම් කරන්න. (ලකුණු 04)
6. එම උපකරණ භාවිතා කිරීමෙන් රංගනය සාර්ථක වන ආකාරය කෙටියෙන් ලියන්න (ලකුණු 04)

3) 1. නාට්‍ය යනු කුමක්ද ? කෙටියෙන් පහදන්න. (ලකුණු 02)
7. කතන්දරයක දක්නට ලැබෙන ලක්ෂණ 02 ක් ලියන්න. (ලකුණු 04)
8. නාට්‍ය හා කතන්දරය අතර ඇති වෙනස්කම් 02 ක් ලියන්න. (ලකුණු 04)

4) 1. ඔබ දන්නා ජනකතා 02 ක් ලියන්න. (ලකුණු 02)
9. එම ජනකතාවලින් ලබා ගත හැකි ආදර්ශ 02 ක් ලියන්න. (ලකුණු 04)
10. එම ජනකතා සංරක්ෂණය කිරීමට ඔබගේ යෝජනා 02 ක් ලියන්න (ලකුණු 04)

5) 1. " සිරිත් මල්දම" ග්‍රන්ථය රචනා කළේ කවුද? (ලකුණු 02)
11. එහි ඇතුළත් නාට්‍යමය අවස්ථාවක් ඉදිරිපත් කිරීමට සුදුසු ඔබ උගත් කවියක් ලියන්න. (ලකුණු 04)
12. " සිරිත් මල්දම" ග්‍රන්ථයෙහි ඇතුළත් යහපත් ආදර්ශ 02 ක් ලියන්න (ලකුණු 04)